
# අනාගතයේ අතීතයේ කතාමාලාව



මනාදී කිසාමා නවරත්නි

# අනාගතයේ අතීතයේ කතාමාලාව

මනෝදි කි-සාමා නවරත්න

# අනාගතයේ අතීතයේ කතාමාලාව


## ඔනාදී තිසාමා නවරත්න

**කතෘ**


**කතෘගේ වෙනත් කෘති**

- ලොකුම වැරැද්ද
- ඔලීනාට තෑග්ගක්
- ඔල්ගා ගේ සිහිනය
- අපූරු ගමන - ඔලිවර්ගේ ත්‍රාසජනක ගමන් - 1 කොටස
- Mother Earth smiled at Olumalee
- Enchanted Present
- Little Olga's dream
- A Mystical Travel – Adventures of Oliver – Part 1
- The Chronicles of the Future’s Past – Adventures of Oliver – Part 2


මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

8 ශ්‍රේණිය



**කෘතිය එළිදක්වන දිනය** 2025-02-08

**ISBN 978-624-208-805-1**

# පිදුම

මගේ සියලු දුක සැප

බලන

ආදර අත්තම්මාට

මෙම පොත

පුදමි.

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



# ඔලිවර්ගේ සොයාගැනීම

ඔහුගේ පළමු අතීත ගමනින් පසු, ඔලිවර්ට එය අමතක කිරීමට නොහැකි විය. එහි වර්ණ, මිනිසුන් සහ සරල ජීවිතය ඔහු පුදුමයට පත් කළේ ය. ඔහුට කාල යන්ත්‍රය සහ ඉතිහාසයේ රහස් ගැන වැඩිදුර ඉගෙන ගැනීමට අවශ්‍ය විය.

ඔලිවර්ගේ සීයා සහ ලොකු මාමාගේ සිත් ඔවුන්ගේ අත්දැකීම ගැන කුතුහලයෙන් පිරුණු අතර, කාල ගමන් දොරටුව පිළිබඳ ව වැඩිදුර සොයා බැලීමට ඔවුන් තීරණය කළහ.

එක සන්ධ්‍යා කාලයක, සීයා ඔවුන් සිය අධ්‍යයන කාමරයට කැඳවා ඔහු සොයා ගත් වැදගත් කරුණු ඔවුන්ට කීවේ ය.

“මම කාල ගමන් දොරටුව පිළිබඳ ව පර්යේෂණ කරා”

ඔහු පැරණි වාර්තා ඇති ටැබ්ලට් එකක් අතැතිව කියා සිටියා.

“එය විද්‍යාත්මක කාර්යයක් පමණක් නොවේ, කාල ගමන් දොරටුව අනතුරු ඇඟවීමක් ලෙස තැනූ දෙයක් කියලා මට හිතෙනවා.”

“අනතුරු ඇඟවීමක්?” ඔලිවර් ඇසීය.

“මොන වගේ අනතුරු ඇඟවීමක් ද?” ඔලිවර් වඩාත් උනන්දුවෙන් සීයාගෙන් ඇසුවේ ය.



සීයා ඔහු සොයා ගත් කරුණු විස්තර කළේ ය,

"එය සෑදූයේ 'ප්‍රාචීනයන්' ලෙස හඳුන්වන අති විශිෂ්ට ජනවර්ගයක් විසින්. ඔවුන් එය හැදුවේ දැනුම සුරැකීමට සහ තමන් පෙර කළ පර්යේෂණ වල දෝෂවලින් ඉගෙන ගැනීමට. නමුත් ඔවුන් ආරක්ෂිත ක්‍රමයක් ද එකතු කළා—ඒ තමයි - කෙතරම් අවශ්‍යතාවක් තිබුනත් කිසිවකුටත් අතීතය වෙනස් කළ නො හැකි බව."

ලොකු මාමා පුදුමයට පත් විය.

"යමක් වෙනස් කිරීමට උත්සාහ කළොත් මොන ව වේවිද?" ලොකු මාමා සීයාගෙන් ඇසුවේ ය.

“කාල දොරටුව යමක් වෙනස් කරන්න උත්සාහ කරන කෙනා ව ඔහුගේ ම කාලයට ආපසු යවනවා,” සීයා කීය. “ඒ නිසා ඉතිහාසය ආරක්ෂා වෙනවා.” සීයා අවධාරණයෙන් කීවේ ය.

ඔලිවර්ගේ හදවත තුළ මෙය සොයා බැලීමට ලොකු උනන්දුවක් ඉපදුණි.

“සීයා, ඔයා හිතනවද ප්‍රාචීනයන් අප වෙනුවෙන් පණිවිඩයක් තබා ඇති බව?” ඔහු සීයා දෙසට නැමී ඇසීය.

“එය විය හැකියි” සීයා පැවසීය.

“ඔවුන් විශ්වාස කළේ, ඉතිහාසයේ කළ වැරදි වලින් අනාගතය වඩා හොඳින් තේරුම් ගැනීමට උපකාරයක් වන බවයි.” සීයා පැවසීය.

# කාල දොරටුවට නැවතත් ගමන් කිරීම

කාල දොරටුවේ රහස පිළිබඳ ව වැඩිදුර සොයා ගැනීමට උනන්දුවෙන්, ඔලිවර්, සීයා සහ ලොකු මාමා නැවතත් කාල දොරටුව වෙත ගියහ.

මෙවර දී, ඔවුන් එය අධ්‍යයනය කිරීමට විශේෂ මෙවලම් ද ගෙන ගියහ. ඔවුන් කාල දොරටුව වෙත පිවිසෙන විට, දොරටුව පෙරට වඩා තදින් දිලෙමින් පැවතුණි. ලොකු මාමාගේ ස්කෑනරය බීප් හඬින් ශබ්ද විය.

“මේක කිසියම් දෙයකට ප්‍රතිචාර දක්වනවා” ඔහු කීය.

කාල දොරටුව අසලට ගිය ඔලිවර්, එහි කලින් නො තිබුණු අමුතු සලකුණු ඇති බව දුටුවේ ය.

“මේවා පසුගිය වතාවේ තිබුණේ නැහැ,” ඔහු සලකුණු හොඳින් පරීක්ෂා කරමින් කීය.



සීයා ඔහුගේ ටැබ්ලට් එක බලමින් සලකුණු ගැන ඔහු සොයා ගත් දේ කීවේ ය,

"මේවා භූගෝලීය සංකේත—කිසිදු ස්ථානයක් නෙවෙයි, නමුත් මේ භූගෝලීය සංකේත වලින් පෙන්නුම් කරන්නේ ඉතිහාසයේ කාලයක්!"

"අපි එහි යන්න ඕනෑ ද?" ඔලිවර් ආසාවෙන් ඇසීය.

සීයා මඳක් සැලකිල්ලෙන් කල්පනා කර ඔහුගේ අදහස කිවේ ය.

"එය භයානක විය හැක, නමුත් ප්‍රාචීනයන් මෙම පණිවිඩය තැබුවේ නම්, එය වැදගත් විය යුතු ය."

# අතීතයට ගමන් කිරීම

ඔවුන් කාල දොරටුව සක්‍රිය කරමින්, ජීවයෙන් පිරුණු සහ පුදුමාකාර තාක්ෂණයකින් යුත් ප්‍රාචීන ජනවර්ගයකට ගියේ ය. එහි ඉතා උස ස්ඵටික ගොඩනැගිලි හිරු එළියට දිලෙමින් පැවතුණි. ශක්ති ප්‍රවාහයෙන් පිරි ගංගා නගරය බල ගන්වමින් ගලා ගියේ ය.

“මෙය ප්‍රාචීනයන්ගේ ලෝකය විය යුතුයි,” ලොකු මාමා මඳ හඬින් කීවේ ය.

ඔවුන් ස්ඵටික කන්දක් තුළ ඇති විශාල ගබඩා ශාලාවක් සොයා ගියහ.

එහි හොලෝග්‍රෑම් ( ආලෝක කදම්බ මගින් මවන ත්‍රිමාන රුව) ප්‍රාචීනයන්ගේ කෙනෙක් ඉතිහාසය පෙන්වීය. ඔවුන්ට විශිෂ්ට තාක්ෂණික ඥානයක් තිබුණ ද, මහත් දෝෂයක් සිදු කළ බව එහි පෙන්විය—අධික සම්පත් පරිභෝජනය කිරීමෙන් තම ග්‍රහලෝකයට ඔවුන් ම හානි කර ගෙන තිබිණි.

මේ නිසා අනාගතය ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුන් ඕසෝන් වැස්මක් සහ කාල ගමන් දොරටුව නිර්මාණය කළ බව ආලෝක කදම්බ මගින් මැවුණු ත්‍රිමාන ප්‍රාචීනයන්ගේ රුව මගින් ඔවුන්ට පෙන්වීය.



එවිට, ඔලිවර්ගේ අවධානය ගත් හොලෝග්‍රෑමයක් ඔහුට දිස් විය. එහි ඔහු මෙන් ම ළමයෙක් දොරටුව අසල සිටියේ ය.

“ඊළඟ පරපුර අපෙන් ඉගෙන ගත යුතු ය,” හොලෝග්‍රෑම් ළමයා පැවසීය.

“ඔබට අතීතය වෙනස් කළ නො හැක, නමුත් අනාගතය ඔබේ තීරණ මත පදනම් වේ.” හොලෝග්‍රෑම් ළමයා ඔලිවර්ගේ ඇස් දෙස බලා කීවේ ය.

# පාඩම

අතීතයට ගිය ගමනින් ප්‍රාචීනයන් වර්තමාන මිනිසුන්ට ඥානවන්ත ව හැසිරෙන්නට සහ ඉදිරි අනාගතය ගැන වගකීමෙන් කටයුතු කරන ආකාරය උගන්වන්නට කැමති බව ඔලිවර් තේරුම් ගත්තා.

ඔවුන් ගෙදර ආපසු ගිය විට, ඔහුගේ සිතට අලුත් අරමුණක් ඇතිවිය.

“සීයා, ප්‍රාචීනයන් කාල යන්ත්‍රයක් නිර්මාණය කළේ කාලය හරහා යන්න පමණක් නොවේ. ඔවුන් අපට ඉතා හොඳ වර්තමානයක් වගේ ම අනාගතයක් සාදා ගැනීමට මඟ පෙන්වන පාඩමක් සාදා තිබුණා,” ඔහු කීය.

“ඔව්, අප දැන් එය ප්‍රවේසමෙන් භාවිතා කළ යුතුයි.” සීයා සිනා වෙමින් කිව්වා.



ඉතිහාසය ගැන ගැඹුරු අවබෝධයක් ලබාගත් ඔලිවර්ට තම ඉතිහාස ව්‍යාපෘතිය සිතා සිටියාටත් වඩා හොඳින් සම්පූර්ණ කිරීමට හැකි විය.

ඉතිහාසය කියන්නේ මිය ගිය අතීතය පමණක් නොව, එය අනාගතය සඳහා මඟ පෙන්වීමක් ලබා දෙන බව ඔහු දැන ගත්තා.

දැන් අතීතය සහ අනාගතය එකිනෙකට වෙනදාටත් වඩා හොඳින් බැඳී ඇති බව ඔලිවර්ට හැඟිණි. ඔහු අතීතයට අනාගතයට මෙන් ම වර්තමානයටත් ගෞරව කිරීමට සිතාගත්තේ ය.

ඔලිවර්ගේ තවත් ත්‍රාසජනක කතාවකින් හමුවෙමු....



පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 978-624-208-805-1